රත්නපුර මහා නගර සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 21 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය

------

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති රත්නපුර මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභාවට අයත් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන රත්නපුර තානායම සඳහා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු කළමනාකරණ ගාස්තුවෙන් සියයට 70 ක් එනම්, රු. 2,682,419 ක් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී එකී ආදායම රු. 925,559 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මහා නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වෙනුවෙන් වන ණය මුදල් පියවීම සඳහා තානායම් කළමනාකරණ ගාස්තුවෙන් සියයට 50 ක් රඳවා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියා කලද, අදාල ගැලපීම් ලෙජර් ගිණුම් තුල පෙන්නුම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරිම්, වරෙන්තු ගාස්තු සහ අතිරේක හර කිරීම් රු. 25,229,948 ක් වුවත් රු. 24,311,409 ක් වශයෙන් ගිණුම්ගත කිරීමෙන් රු. 918,539 ක් ගිණුම් වල අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) වරිපනම් බදු ගිණුමේ ආරම්භක හිඟ ශේෂය රු. 21,861,507 ක් වුවද, 2012 වර්ෂයේ පරිගණක මුද්‍රිත අනුව ආරම්භක වරිපනම් බදු හිඟ ශේෂය රු. 22,147,954 ක් විය.

(ඉ) වරිපනම් බදු සඳහා වර්ෂයේ ලැබීම් රු. 26,143,339 ක් වුවද, ජ'නල් සටහන් අංක 10 මගින් වරිපනම් බදු ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණේ රු. 25,332,439 ක් පමණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දේපල ණය පොලී ප්‍රතිපූර්ණ ආදායම රු. 1,304,323 ක් වුවද මාර්තු මස ආදායම වූ රු. 101,308 ක් පමණක් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ආදායම රු. 1,203,019 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, රු. 1,095,249 ක් සේවක ණය ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(උ) පසුගිය වර්ෂයන්ට අදාලව දේපල ණය පොලී ප්‍රතිපූර්ණය රු. 1,295,024 ක් දේපල ණය පොලී ප්‍රතිපූර්ණය ගිණුමට ගිණුම්ගත කල යුතු වුවද, උක්ත අගය සේවක ණය ගිණුමට ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු සේවක ණය ගිණුමේ ශේෂය මෙකී ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) තථ්‍ය වශයෙන් කලින් ලැබීම් කිසිවක් නොමැති වුවත්, ලෙජර් ගිණුමේ රු. 1,191,125 ක් කලින් ලද ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) ප්‍රධාන බස් නැවතුම්පල බස් රථ ගාල් ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ දී සබරගමුව බස් සමාගමෙන් ලැබිය යුතු රු. 360,000 ක් සඳහා බිල්කිරීම සිදු කර නොතිබුණි.

(ඒ) මහා නගර සභාව සතු දේපල බදු දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද අවම එක්වන් මුදල (Key Money) රු. 4,677,179 ක් සහ පුළුගපිටිය පොදු වැසිකිලිය අසල ඉඩම බදු දීමේ අවම එක්වන් මුදල රු. 2,600,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමට නොගෙන විවිධ තැන්පතු තුල දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ නාගරික මන්ත්‍රී දීමනා අය ශීර්ෂ අංක 10371(2) සඳහා රු. 1,392,000 ක් බැර විය යුතු වුවත්, යතුරුපැදි ණය සඳහා නියමිත වාරිකය වූ රු. 240,000 අඩු කිරීමෙන් අනතුරුව ආදායම් ලෙස රු. 1,152,000 ක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඕ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙහි ප්‍රධාන විධායක නිලධාරීගේ 2012 ජූලි 24 දිනැති ලිපිය අනුව මහජන පොළ ප්‍රවේශ මාර්ගය හා බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා වූ ණය මුදල සමාලෝචිත වර්ෂය අවසානයට රු. 37,553,724 ක් වුවද, අදාල ණය ගිණුමට අනුව ශේෂය රු. 28,002,506 ක් විය.

(ක) ප්‍රවේශ මාර්ගය හා බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ සමාලෝචිත වර්ෂයේ ලද රු. 13,002,117 ක මුදල ආදායමට ගෙන නොතිබුණි.

(ඝ) උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කල යුතු වුවත් පසුගිය වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු. 16,701,616 ක් වර්ෂයේ ආදායමට ගෙන තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන් සඳහා මුද්දර ගාස්තු හඳුනාගෙන නොමැති අතර, හඳුනා ගෙන ඇති වටිනාකමට අදාලව රු. 11,097,970 ක් පිළිබඳ කිසිදු තොරතුරක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. තවද 2011 වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා මුද්දර ගාස්තුව රු. 7,189,966 ක් ලැබිය යුතු ආදායම් වශයෙන් ගිණුම මඟින් හෙළිදරව් නොවුණි.

(ච) නගරාධිපති නිල රථය මිලදී ගැනීමේදී දරන ලද රු. 11,735,400 ක වියදමින් රු. 7,000,000 ක් අදාල වැය ශීර්ෂයට හර කර නොතිබූ අතර, සභාවේ වියදම උක්ත අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවක ණය, අඟරු චෙක් පත් හා අතුරු අග්‍රිම ( අත්තිකාරම්) ගිණුම් ශේෂ, ශේෂ පත්‍රය හා ලේඛන අතර රු. 1,075,112 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ට) විගණන නියැදි පරීක්ෂාවේදී 2012 වර්ෂයේ ආදායම් අය විෂයයන් 13 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 15,131,125 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 13,394,027 ක් වූයෙන් රු. 2,580,501 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඩ) සමාලෝචිත වර්ෂයේ සත්‍ය ණයගැති ලැබීම් රු. 30,806,900 ක් වුවද ආදායම් ණයගැති ගිණුමට රු. 30,712,524 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(න) සභාවෙහි වැය ලෙජර යාවත්කාලීනව පවත්වා නොතිබූ බැවින් විගණනය විසින් කරන ලද නියැදි පරීක්ෂාවේදී වැය විෂයයන් 61 කට අදාලව වැය ලෙජරයන් හා වැය වර්ගීකරණයන් අතර රු. 365,642,482 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2012 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 33 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු. 348,606,901 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 117,377,383 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,168,213 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,281,551 ක් විය.

2.2 නිරවුල් නොකළ ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද දිගුකාලීන ණය ගිණුම් ශේෂයන්හි එකතුව රු. 69,382,992 ක් විය.

2.3 බැංකු සැසඳුම්

(අ) නිකුත් කර මාස 06 ක කාලයක් ඉකුත් වූ රු. 2,173,164 ක් වූ චෙක්පත් 77 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 01 සිට 05 දක්වා කාලයට අදාල එකතුව රු. 302,179 ක් වූ අඟරු චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් අයකර නොගත් ආදායම් අයකර ගැනීමට හෝ ඒ පිළිබඳව නීතිමය පියවරක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 22,319 | 26,436 | 19,807 |
| (ii) බදු කුලී | 48,211 | 36,606 | 11,605 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,665 | 2,027 | 638 |
| (iv) වෙනත් ආදායම් | 16,874 | 23,830 | - |

2.4.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායමෙන් රු. 128,525 ක් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභා තීරණ මත දිළිඳු සහන බදු නිදහස් කිරීමේ පදනම යටතේ කපා හැර තිබුණි.

2.4.3 බදු කුලී

--------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදු කුලී ලේඛනය අනුව බිම් බදු ඒකක 452 ක් සටහන්ව ඇතත් එය යාවත්කාලීන වූ තොරතුරු බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. එසේම සමාලෝචිත වර්ෂය තුළදී ඉඩම් තක්සේරු කර බිම්බදු අය කිරීමක් හෝ ගිවිසුම්ගත වීමක්ද සිදු වී නොතිබුණි. ගිවිසුම්ගතවීම් 42 ක් පමණක් සිදු වී තිබූ අතර, බිම්බදු සඳහා කාර්තුවක වටිනාකම ශත 37 ශත 75 ආදී වශයෙන් ඉතාමත් සුළු අගයක් බව නිරීක්ෂණය විය.

(ආ) බිම්බදු අය කරනු ලබන ඒකක 452 ක් අතරින් ඒකක 103 ක් සඳහා රු. 5,000 කට වඩා වැඩි හිඟ ශේෂය 2013 පළමු කාර්තුව වන විට රු. 3,041,966 ක් විය.

(ඇ) ඉහත බිම් බදු ඒකක 452 ක් අතරින් බදු ඒකක 22 ක් සඳහා බිල් කිරීම් දීර්ඝ කාලයක සිට අත්හිටුවා තිබු අතර, එම අත්හිටුවීමට කිසිඳු පදනමක් විගණනයේදී නිරීක්ෂණය නොවුණි. එම ඒකක 22 තුලින් රු. 30,146 ක් අයවීමට තිබුණි.

2.4.4 වෙනත් ආදායම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු වෙළඳසැල් හිඟ කඩකුලී රු. 571,965 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට හා පසුගිය වර්ෂයන්ට අදාලව සභාවට අයත් රත්නපුර තානායම සඳහා ලැබිය යුතු කළමනාකාරීත්ව ගාස්තුවේ සියයට 20 ප්‍රමාණය රු. 766,405 ක් සභා අරමුදලට අය කර ගැනීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) බස්රථ ගාල් ගාස්තු වශයෙන් මහා නගර සභාවට සබරගමුව බස් සමාගමෙන් 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වර්ෂ 07 කට අදාලව ලැබිය යුතු ආදායම රු. 1,320,000 ක් විය.

(ඈ) නිව් ලක්ෂ්මි සිනමා ශාලාව පිහිටි ගොඩනැගිල්ල සඳහා වන හිඟ කුලී මුදල රු. 697,500 ක් සමාලෝචිත වර්ෂයේදී ද පියවා ගැනීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) රත්නපුර බස්නැවතුම්පල වැසිකිලිය සඳහා 2012 අප්‍රේල් සහ මැයි මස හිඟ ගාස්තු වූ රු. 450,605 ක මුදල නියමිත බදුකරුගෙන් අය කර ගැනීමට කිසිඳු පියවරක් ගෙන නොතිබූ අතර, එම වැසිකිලි

පද්ධතිය සඳහා අදාල පරිදි ජල මනුවක් සවි කර නොතිබීම හේතුවෙන් ජල ගාස්තු ප්‍රමාණය ගණනය කර බදුකරුගෙන් අය කර නොතිබුණි.

(ඊ) මහා නගර සභාව සතු පොදු වෙළඳසැල කඩකාමර 49 ක් තුලින් සමාලෝචිත වර්ෂයේ දී කඩකාමර 06 ක් සඳහා කිසිඳු ආදායමක් නොලබා වසා දමා තිබුණි.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

2.5 අධිභාර

-------

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226(1) විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 124,467 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

(ආ) එකතුව රු. 15,004,761 ක්වූ ගනුදෙනු 09 ක් සම්බන්ධයෙන් මා විසින් ඉදිරියේදී අධිභාර පියවර ගැනීමට යෝජිතව ඇත.

2.6 අවිධිමත් ගනුදෙනු

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මැයි මාසයේදි අවශ්‍යතාවයකින් තොරව රු.400,000 වටිනාකමට සිමෙන්ති මලු 500 ක් මිලදි ගෙන තිබුණි.

(ආ) ඉන්ධන අත්තිකාරම් පියවීමේදී ඉදිරිපත් කරන ලද ඉන්ධන බිල්පත් වල වාහන අංක යොදා තිබිය යුතු වුවද එසේ වාහන අංක යොදා නොමැතිව රු. 57,341 ක් ඉන්ධන සඳහා ගෙවා තිබුණි.

(ඇ) නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කර තිබූ පිරිවිතර වලට අනුව පෞද්ගලික ආයතනයකින් සමාලෝචිත වර්ෂයේදි රු.2,340,000 ක වටිනාකමට පුටු 500 ක් මිලදි ගෙන තිබුණි.

යථෝක්ත පුටු 500 නියමිත පිරිවිතර වලට අනුකූල නොවූවද, නියමිත පිරිවිතර වලට අනුකූල බවට අදාල ලැබීම් පත්‍රිකා වල නිළධාරීන් විසින් සටහන් යොදා ගෙවීම් නිර්දේශ කර තිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 14,575,609 ක් වූ ව්‍යාපෘති 43 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේ ඇස්තමේන්තු කර ඇතත් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) වැඩ බිම් වලට ලැබූ ද්‍රව්‍ය හා භාවිතය පිළිබඳව වාර්තාවක් අදාල වැඩබිමේ පවත්වා ගත යුතු වුවද, 2012 මැයි 24 දින රු. 273,840 කට මිලදී ගත් සිමෙන්ති මලු 326 ක භාවිතය පිළිබඳව වූ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

2.8 මෙහෙයුම් අකර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම, දෙන ලද කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවත්, 1990 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 09 කදී ගෙවන ලද එකතුව රු. 17,942,664 ක අත්තිකාරම් විගණිත දිනය වූ 2013 ජූනි 10 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා තීරණයක් අනුව හිඟහිටි විදුලිය සහ විදුලිය ගබඩා ගිණුම් වල ශේෂ එකතුව වූ රු. 24,175,270 ක් හඳුනා ගැනීමෙන් තොරව ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී ද ඒ පිළිබඳව හඳුනා ගැනීමක් සිදු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කිසිඳු අනුමැතියකින් තොරව වැය ශිර්ෂයන් 04 කට රු. 5,066,085 ක මුදල් ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඈ) සේවා ස්ථාන මාරු වී ගිය සේවකයින් 55 දෙනෙකුගේ රු. 823,919 ක ආපදා ණය අත්තිකාරම් ශේෂ අයවීමට තිබුණි.

(ඉ) මහා නගර සභාව සතු ලක්ෂ්මි සිනමා ශාලාව වර්ෂ ගණනාවක සිට වසා දමා ඇති අතර, ආර්ථික වශයෙන් ඉතා වටිනා ස්ථානයක පිහිටි ගොඩනැගිල්ල ඵලදායක ආර්ථික කටයුත්තක් සඳහා යෙදවීම පිළිබඳව අවධානයට ලක්ව නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව වටිනාකම රු. 458,450 ක ඉකුත් තැන්පතු නියාදනය කර නොමැතිව අචල ජංගම වත්කම් ලෙස ශේෂ පත්‍රය තුල පෙන්නුම් කර තිබුණි.

(උ) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 136(ආ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුල අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර 56 ක් ඉදිරිපත් වී තිබූ අතර, එම ඉල්ලුම් පත් වලට අදාල ගස් 16 ක් කපා ඉවත් කර තිබුණි. අනතුරුදායක ගස් ඉවත් කිරීම් 10 ක් මහා නගර සභාව මඟින් වියදම් දරා සිදු කර තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් මහා නගර සභාවට ලැබිය යුතු වූ රු. 444,915 ක මුදල අය කර ගැනීමට කිසිඳු පියවරක් ගෙන නොතිබූ අතර, උක්ත ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින්ද හෙළිදරව් කර නොතිබුණි.

2.9 මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) තත්කාර්යය පදනම මත සේවය ලබා ගැනීම සඳහා යම්කිසි නිශ්චිත කාර්යයක් පැවතිය යුතු අතර, ඒ සඳහා වැය වන වියදම සහ අදාල කාර්යය ආරම්භ වන හා අවසාන වන දින කාල සීමාව පිළිබඳව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කල යුතු වුවත් එසේ කටයුතු කිරීමකින් තොරව 2011 දෙසැම්බර් 28 දින පවත්වා තිබූ මහා සභා රැස්වීම් තීරණ අංක 154 යටතේ ගොඩනැගිලි අංශය සඳහා බඳවා ගන්නා ලද තත්කාර්යය පදනමේ සේවකයින් 74 ක් සඳහා 2012 අගෝස්තු මාසය වන විට එකතුව රු. 5,002,775 ක් වූ වැටුප් ගෙවා තිබුණි.

(ආ) රාජ්‍ය ආයතන සඳහා තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමේදී පුරප්පාඩු වූ ස්ථිර තනතුරට අදාලව නීත්‍යානුකූල සේවා ගිවිසුමක් මත බඳවා ගැනීම සිදු කල යුතු වුවත්, එසේ විධිමත් සේවා ගිවිසුමක් මඟින් බඳවා නොගත් සේවකයින් 167 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 14,453,098 ක් වැටුප් වශයෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) අනියම් හා ආදේශක පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් සඳහා දෛනික පදනම මත වැටුප් ගෙවීමේදී එක් එක් සේවකයා වෙනුවෙන් වැටුප් ගණනය කිරීම සඳහා පදනම් කරගනු ලබන දින ගණන සේවයේ යෙදුන දින ගණනට වඩා වෙනස් වන අවස්ථා විගණන නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) මහා නගර සභාවේ තනතුරු වර්ග 05 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන ස්ථිර පත්වීම් 07 ක් ලබා දී තිබුණි. එම තනතුරු සඳහා වැටුප් ප්‍රතිපූර්ණයන්ද සිදු කර තිබූ අතර,

(ඉ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව අනුව පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාව 89 ක් වුවත් අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් වශයෙන් සේවකයින් 201 ක් බඳවා ගැනීම තුලින් එකී පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාව ඉක්මවා ප්‍රධාන ලේකම්ගේ නොවැම්බර් 16 දිනැති අංක 01/2010 හා 2010 දරන චක්‍රලේඛ විධිවිධාන වලට අතිරික්ත සේවකයින් 112 ක් බඳවා ගෙන තිබුණි.

(ඊ) ප්‍රධාන ලේකම්ගේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2010, 2011 සහ 2012 වර්ෂය තුලදී අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් වශයෙන් සේවකයින් සඳහා පිළිවෙලින් රු. 17,008,859 , රු. 19,202,064 , රු. 29,193,687 ක් සභා අරමුදලින් වැයකර තිබුණි. තවද සේවකයින් බඳවා ගත් තනතුරු වලට පරිබාහිර තනතුරු වල සේවයේ යෙදවා තිබුණි.

2.10 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්නපුර නගර සීමාව තුල ඇති කි.මී. 22 ක් වූ ප්‍රධාන මාර්ග වල සහ කි.මී. 15 ක් වන අතුරු මාර්ග වල එකතු කරන අපද්‍රව්‍ය බැහැර කිරීම කණාදොල ප්‍රදේශයේ සිදු කරනු ලැබේ. අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයට රැගෙන එන කසළ එකී ස්ථානයේ පිහිටි කන්දෙන් පහලට අවිධිමත් ලෙස බැහැර කරන බව අනාවරණය විය. එමෙන්ම මෙම කසළ ගොඩ දැනට ගිණිගෙන දැවෙමින් පවතින අතර, පරිසරයට අහිතකර වායු මුදා හැරීම පිළිබඳව සලකා බලා එවැනි තත්ත්වයක් තිබේ නම් එම තත්ත්වය අවම කරලීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) මහා නගර සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ කණාදොළ ඝන අපද්‍රව්‍ය බැහැර කරන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 4,391,264 ක පිරිවැය ඇස්තමේන්තුවක් පදනම් කරගෙන ඒ සඳහා රු. 2,355,000 ක් වියදම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම ඒකකය විධිමත්ව පවත්වා නොගැනීම මත අසාර්ථක වීමෙන් පසුව දැනට වර්ෂ 05 ක පමණ කාලයක සිට එම ස්ථානයට රැගෙන එන මළ අපද්‍රව්‍ය, කසළ බැහැර කරන ස්ථානයටම බැහැර කරන බව අනාවරණය විය. මහා නගර සභාවෙන් මාසිකව මළ අපද්‍රව්‍ය කියුබ් 70 – 75 ක් පමණ බැහැර කරන බවත්, ඊට අමතරව කුරුවිට ප්‍රාදේශීය සභාවෙන් රැගෙන එන මළ අපද්‍රව්‍යද එම ස්ථානයේම විවෘත පරිසරයට බැහැර කරන බවත් වැඩිදුරටත් අනාවරණය විය.

මෙම අසතුටුදායක තත්ත්වය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට මෙන්ම පරිසරයටද හානිදායක වන බව නිරීක්ෂණය විය.

(ඇ) සභාව සතු අක්කර 25 කට අධික වූ කණාදොල කසළ බැහැර කරන භූමිය අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බව නිරීක්ෂණය වූ අතර, මෙකී දේපල ආරක්ෂා කර ගැනීම සඳහා මහා නගර සභාව විසින් ආරක්ෂක වැටක් ඉදිකිරීම හෝ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවැය පාලනය.

(ඇ) මූල්‍ය පාලනය .

(ඈ) ආදායම් පරිපාලනය .

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) වත්කම් කළමනාකරණය

(උ) මානව සම්පත් කළමනාකරණය

(ඌ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.